මගේ අංක : ජේඑස්සී/ඊජ්/ස්ථානමාරු-2021

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
සිවිල් අභියාචනා මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
දිසා විනිශ්චයකාරවරුන්, මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

**ඒකාබද්ධ සේවා චක්‍ර ලේඛ අංක 01/2020 අනුව අධිකරණ වල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් හා උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීම සම්බන්ධවයි.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක: COM/Trans/V/වාස්මා/2021 හා 2020.08.31 දිනැති ලිපිය පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානය යොමු වී ඇත.

02. අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණය පරිදි මගේ සමාංක: HRM/DO හා 2019.06.24 දිනැතිව යොමු කරන ලද ලිපිය ප්‍රකාරව අධිකරණයන්හි සේවය කරනු ලබන ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරීන් හා උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරීන්ගේ අභ්‍යන්තර ස්ථාන මාරුවීම් හා අනුයුක්ත කිරීම්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිර්දේශය යටතේම සිදු කළ යුතු බව සියලුම අධිකරණයන් වෙත දන්වා යවා ඇත.

03. එනමුත්, ඒකාබද්ධ සේවාවේ වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් පත් යොමු කළයුතු අවසන් දිනය 2020.09.30 වන බැවින්, එදිනට පෙර අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගෙන එකී අයදුම් පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීමට කාලය ප්‍රමාණවත් නොවිය හැකි බැවින්, එම අයදුම් පත් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත මාර්ගගත ක්‍රමය ඔස්සේ පමණක් ඉදිරිපත් කිරීම සඳහා උක්ත නිලධාරීන්ට අවස්ථාව ලබා දීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

04. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තම නිර්දේශය **අනුප්‍රාප්තිකයෙක් සහිතව** ලෙස සටහන් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ ඇතුළත් කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව අවසර ලබා දීමට තීරණය කර ඇති අතර එසේ ක්‍රියා කිරීමෙන් අනතුරුව අයදුම් පත්‍රයෙහි දෘඪ පිටපත මා වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

05. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ලබා දීම සම්බන්ධයෙන් යම් ගැටලුකාරී තත්ත්වයක් මතු වන්නේ නම් පමණක් ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා අයදුම් පත්‍ර මා වෙත යොමු කළ යුතුය.

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

2020 සැප්තැම්බර් මස 22 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12